**රඹුක්කන ප්‍රාදේශීය සභාව**
**කෑගල්ල දිස්ත්‍රික්කය**

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය 2014 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 අගෝස්තු 25 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට රඹුක්කන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>.

1.3.1 <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.</u>

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 21(ඉ) වගන්තිය අනුව අදාල ආයතනයේ අයවැයගත දත්ත සමඟ තථ්‍ය දත්ත මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කලයුතු වුවත්, එසේ ඉදිරිපත් කර නොතිබූ අතර ප්‍රමිතියේ 21(ඈ) වගන්තිය අනුව හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු. 204,603 ක් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබූ අතර ඉකුත් වර්ෂ සඳහා මෙම අරමුදලට ගෙවිය යුතුව තිබූ රු. 633,312 ක වාරික මුදල් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු රු. 53,450 ක මුද්දර ගාස්තු සේවා දීරි දීමනා, මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබූ අතර, ඉකුත් වර්ෂ සඳහා ගෙවිය යුතු රු. 121,000 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඇ) ඉඩම 02 ක් විකිණීම මත 1% ක බදු වශයෙන් අයවිය යුතු රු. 27,384 ක් ගිණුම් වලින් අත්හැරී තිබුණි.

(ඈ) සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ට අයත් රු. 8,327,075 ක් වූ වාහන 12 ක් සහා අයිතියට පවරා නොගෙන ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර තිබුණි.

1.3.3 <u>අසම්භාව්‍ය බැරකම්</u>

සභාවේ වත්කම් හා වගකීම් සම්බන්ධව බැඳී පවතින අසම්භාව්‍ය බැරකම් වටිනාකම ගණනය කර ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

1.3.4 <u>නොසැසඳුන පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 09 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 67,458,743 ක් වූ අතර, ඊට අදාල උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 59,840,382 ක් වූයෙන් වෙනස රු. 7,618,361 ක් විය.

1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම වූ රු. 1,215,837 න් සියයට 84 ක්, එනම් රු. 1,023,550 ක් වසරකට වඩා පැරණි විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 3,482,175 ක් විය.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම.

මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් එකතුව රු. 3,482,175 ක් වූ විවිධ ණයහිමි ශේෂයන් සම්බන්ධයෙන් අනුශාංගික සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

1.3.7 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි, විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) සබරගමුව පළාතේ පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය | |
| 261.2.2 රීතිය | වර්ෂ 2005 සිට 2008 දක්වා අවස්ථා 05 කදී ලබාදුන් රු. 49,622 ක තත්කාර්ය අතුරු අග්‍රිම 2013 ඔක්තෝබර් මස විගණන අවස්ථාව වන විටත් පියවා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදය | |
| (i) 1.7 ඡේදය | රු. 90,530 ක දේපල ණය මුදලක් 2011 අගෝස්තු මස සිට අය නොවී හිඟ ශේෂයක්ව පැවතුනද, එම ණය ගෙවීමට අදාල ඉඩමේ ඔප්පුව හා ඇටෝර්නි බලය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |
| (ii) 10.4 ඡේදය | වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ නොකල නිලධාරිණියක් සඳහා ආපදා ණය මුදලක් ගෙවීමේදී වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කළ ඇපකරුවෙකු ලබාගත යුතු වුවද, එසේ නොමැතිව රු. 58,300 ක ණය මුදලක් ගෙවා තිබූ අතර, එම නිලධාරිණිය සේවය හැර යාම හේතුවෙන් අයකරගත නොහැකිව පැවතුණි. |

02. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 18,006,363 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,021,408 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය තුල මූල්‍ය ප්‍රතිඵලය රු. 14,984,955 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

2.2 <u>විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ කුලී ආදායම්, සේවා සඳහා ගාස්තු, දඩ හා වරෙන්තු ගාස්තු හා වෙනත් ආදායම් වැඩි වීමත්, සැපයුම් හා උපකරණ වියදම හා ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා වියදම අඩු වීමත් ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.3 <u>ආදායම් පරිපාලනය</u>

2.3.1 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

<u>ආදායම් ප්‍රභවය</u>

| | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර්31දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) වරිපනම් හා බදු | 4,752 | 5,516 | 3,056 |
| (ii) බදු කුලී | 7,694 | 7,537 | 564 |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,308 | 2,489 | 684 |
| (iv) වෙනත් ආදායම් | 57,297 | 56,135 | 5,205 |

2.3.2 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 2,300,635ක් හා රු. 6,841,126ක් විය.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ) ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ බිම් මහලේ වර්ග අඩි 2,000 බැගින් වූ කොටස් දෙකක් සම්පත් බැංකුව හා ජාතික ඉතිරිකිරීමේ බැංකුව සඳහා මාසික කුලිය පිළිවෙලින් රු. 80,000 ක් හා රු. 75,000 බැගින් බදු දී තිබුණි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවියයුතු එකතු කල අගය මත බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද හා මුද්දර බද්ද මාසික කුලියට එකතු කර අයකරගත යුතු වුවද, සභා අරමුදලට ලද මාසික කුලී මුදලින් බදු ගෙවා තිබීම හේතුවෙන් 2011 මාර්තු සිට විගණන අවස්ථාව වන 2013 සැප්තැම්බර් මාසය දක්වා සභා අරමුදලට රු. 565,554 ක අලාභයක් සිදුවී තිබූ අතර, රු. 105,716 ක බදු මුදලක් රජයට අහිමිවී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල අසල ඉඩම සභාව විසින් 1980 ජූලි මස සිට බද්දට ලබාගෙන තිබුණි. හිඟ බදු මුදල වශයෙන් රු. 216,834 ක් දුම්රිය දෙපාර්තමේන්තුවට නිරවුල් නොකිරීම හේතුවෙන් අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතිද්දී, මෙම ඉඩම් කොටස පෞද්ගලික බස් රථ ගාලක් සඳහා සබරගමුව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට බදු දී තිබුණි. එම අධිකාරියෙන් 2011 දෙසැම්බර් 31 දින දක්වා පමණක් රු. 815,500 ක බදු මුදලක් අයවිය යුතුව තිබුණද, බදු ගිවිසුමකින් තොරව ලබා දීම නිසා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටද නොහැකිවී තිබුණි.

3.2 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

3.2.1 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

2013 ඔක්තෝබර් 29 දින කරන ලද භෞතික පරික්ෂාවේදි පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ඇස්තමේන්තුගත වියදම රු. 876,473 ක් වූ පින්නවල වෙළ මැද මාර්ගය කොන්ක්‍රීට් කිරීමට අදාල කර්මාන්තයෙහි කොන්ක්‍රීට් කල මාර්ගය දෙපස පස් කියුබ් 05 ක් යොදා පිරවූ බවට රු. 16,575 ක් ගෙවීම් කර තිබුණද, මිනුම් වාර්තාව ප්‍රකාරව පස් පුරවා නොතිබූ අතර, වැඩ විෂය අංක 08 ට අනුව නාම පුවරුවක් සවි කිරීම සඳහා රු. 6,000 ක් ගෙවා තිබුණද, නාම පුවරුවක් සවි කර නොතිබුණි.

(ආ) රු. 372,300 ක් වැයකර සම්පූර්ණ කර තිබූ අලි අනාථාගාරය ඉදිරියෙන් මා ඔයට පිවිසෙන මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය සම්බන්ධයෙන් කරනු ලැබූ භෞතික පරීක්ෂාවේදී එහි වැඩ විෂය අංක 02 ට අදාලව ඉටු නොකල කොන්ක්‍රීට් කියුබ් 0.79 ක් සඳහා රු. 31,985 ක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

04. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

<u>අභ්‍යන්තර විගණනය</u>

1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

05. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) කොන්ත්‍රාත් පාලනය